# DISTANCE CRITERIA EXEMPTION FOR OWNER PHARMACISTS

The National Medicines Regulatory Authority (NMRA) hereby notifies all pharmacists and stakeholders regarding the **distance criteria exemptions** for new retail pharmacies.

These changes are designed to regulate the establishment of new pharmacies and ensure that professional pharmaceutical services are provided by registered pharmacists who maintain direct ownership and responsibility.

### 1. Effective Date

The revised distance criteria exemption for owner pharmacists will come into effect on **1st January 2026**.

### 2. Eligibility Requirements

Applications for exemption from the standard distance criteria will be accepted **only** if the following condition is met:

- **Sole ownership:** The applicant pharmacist must be the **sole owner** of the retail pharmacy.
- **Responsible Pharmacist:** The owner must serve full-time as the **Responsible Pharmacist** of the premises.
- Compliance with all other applicable criteria and requirements, as per **National Medicines Regulatory Authority Act, No. 5 of 2015** and Regulations, is mandatory.
- Following the issuance of Location Approval, the Business Registration Certificate (BRC) must be submitted prior to appearing for the interview.

### 3. Non-Transferability of Ownership

- The ownership of a pharmacy established under this exemption **shall not be transferable** to any other party.
- The licence issued under this exemption **shall be strictly limited to the owner-pharmacist** who satisfies the exemption criteria.

If a pharmacist undergoes **any change in ownership** or **closure** of a previously owned pharmacy after 01st Jan 2026, that pharmacist will **not be eligible** to submit new applications for districts where the NMRA has withheld the acceptance of new applications.

All applicants are strongly advised to take note of these requirements before submitting applications for new retail pharmacy licenses. Pharmacists who fail to comply with these Guidelines, and applications that do not meet the requirements, shall be rejected.

Dr. K.M.G.K. Bandara
MBBS, MSc, MD (Com. Med), MA (Sociology)
Chief Executive Officer (Acting)
National Medicines Regulatory Authority
Colombo 02.

**Chief Executive Officer**
National Medicines Regulatory Authority (NMRA)
*Issued on: 01st Jan 2026*

# හිමිකාර ඖෂධවේදීන් (Owner Pharmacist) සඳහා ලියාපදිංචි ඖෂධශාලා අතර පැවතිය යුතු අවම දුර සීමාව (Distance criteria) නිදහස් කිරීම සම්බන්ධව

ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) විසින් නව සිල්ලර ඖෂධශාලා සඳහා වන අවම දුර සීමාව (**Distance criteria**) නිදහස් කිරීම් සම්බන්ධයෙන් සියලුම ඖෂධවේදීන් සහ අදාළ පාර්ශවකරුවන් මෙයින් දැනුවත් කරනු ලබයි.

මෙම වෙනස්කම් සිදු කරනු ලබන්නේ නව ඖෂධශාලා පිහිටුවීම නියාමනය කිරීමට සහ ලියාපදිංචි ඖෂධවේදීන්ගේ සෘජු හිමිකාරිත්වය සහ වගකීම යටතේ වෘත්තීයමය ඖෂධ සේවාවක් මහජනතාවට ලබාදීම සහතික කිරීම සඳහාය.

## 1. ක්‍රියාත්මක වන දිනය

හිමිකාර ඖෂධවේදීන් සඳහා වන මෙම සංශෝධිත අවම දුර සීමාව (**Distance criteria**) නිදහස් කිරීමේ ප්‍රතිපත්තිය **2026 ජනවාරි මස 01** වැනි දින සිට ක්‍රියාත්මක වේ.

## 2. සුදුසුකම් සපුරාලීමේ අවශ්‍යතා

අවම දුර සීමාවවෙන් නිදහස් වීම සඳහා වන අයදුම්පත් භාරගනු ලබන්නේ පහත සඳහන් අනිවාර්ය කොන්දේසි සපුරා ඇත්නම් පමණි:

- **තනි හිමිකාරිත්වය:** අයදුම්කරු අදාළ සිල්ලර ඖෂධශාලාවේ **තනි හිමිකරු** (Sole-owner) විය යුතුය.
- **වගකිවයුතු ඖෂධවේදියා:** අදාළ හිමිකරු විසින්ම එම ඖෂධශාලාවේ **වගකිවයුතු ඖෂධවේදියා** (Responsible Pharmacist) ලෙස පූර්ණකාලීනව සේවය කළ යුතුය.
- 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරී (NMRA) පනත සහ රෙගුලාසිවලට අනුව, අදාළ වන අනෙකුත් සියලුම නිර්ණායක සහ අවශ්‍යතාවලට අනුකූල වීම අනිවාර්ය වේ.
- ස්ථාන අනුමැතිය (Location Approval) නිකුත් කිරීමෙන් පසුව, සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටීමට පෙර ව්‍යාපාර ලියාපදිංචි සහතිකය (BRC) ඉදිරිපත් කළ යුතුය.

## 3. හිමිකාරිත්වය පැවරිය නොහැකි වීම.

- මෙම නිදහස් කිරීම් යටතේ පිහිටුවන ලද ඖෂධශාලාවක හිමිකාරිත්වය වෙනත් කිසිදු පාර්ශවයකට **පැවරිය නොහැක.**
- මෙම බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ අදාළ නිදහස් කිරීමේ නිර්ණායක සපුරාලන ලද හිමිකාර ඖෂධවේදියාට (Owner Pharmacist) පමණක් වන අතර එය ඔහුට/ඇයට පමණක් සීමා වේ.

යම් ඖෂධවේදියෙකු හිමිකාරිත්වය දැරූ ඖෂධශාලාවක හිමිකාරිත්වය 2026 ජනවාරි 01 දිනට පසු වෙනස් කර ඇත්නම් හෝ එය වසා දමා ඇත්නම්, එම ඖෂධවේදියාට, ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) විසින් නව අයදුම්පත් භාරගැනීම තාවකාලිකව අත්හිටුවා ඇති දිස්ත්‍රික්ක සඳහා නව අයදුම්පත් ඉදිරිපත් කිරීමට **සුදුසුකම් නොලැබේ.**

සියලුම අයදුම්කරුවන් නව සිල්ලර ඖෂධසල් බලපත්‍ර සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමට පෙර මෙම අවශ්‍යතා පිළිබඳව දැඩි ලෙස අවධානය යොමු කළ යුතුය. මෙම මාර්ගෝපදේශවලට අනුකූල වීමට අපොහොසත් වන ඖෂධවේදීන් සහ අවශ්‍යතා සපුරා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

වෛද්‍ය කේ.එම්.පී.කේ. බණ්ඩාර
MBBS, MSc, MD (Com. Med), MA (Sociology)
ප්‍රධාන විධායක නිලධාරී (වැ.බ)
ජාතික ඖෂධ නියාමන අධිකාරිය
... රාමනායක මාවත, කොළඹ 02.

**ප්‍රධාන විධායක නිලධාරී**
ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA)
නිකුත් කළ දිනය: 2026 ජනවාරි 01